


කුල සිරිතට අනුව ස්වයංවර උළෙලින්
අන් රජවරුන් අභිබවමින් පෙරට ගොසින්
යසෝදරා දුන් ස්වයං වරය තුළින්
යුග දිවි ඇරඹුවේ වෙන් වන්නද මෙලෙසින්

යස ඉසුරින් පිරුණු රජ සැප හැර දමමින්
අපිස් දිවියේ ආශාවන් මතු කරමින්
භවයේ දුක නිවන මඟ සොයමින්
සිදුහත් රජතුමා සමුගති රජ විමනෙන්

විරහා වේදනාවෙන් හද තැවි නිතින
මහමෙර උසට දුක උසුලාගෙන හදින
රාහුල සිඟිති පුතුගේ රුව තුළ ගැටෙන
සිතුවම් වලින් ඔබ රුව මැවෙනවා බැතින

සසරින් සසර ඔබ මගෙ හිමිතුම වූවා
මේ භවයෙදිත් පැතු ලෙස එය ඉටු වූවා
රන් රස වගේ යුගදිවි මෙතුවක් ගෙවුවා
එනමුත් අනේ අද මා මෙහි තනි වූවා

ගෙන ගිය ගමන් මඟ දෛවය ගෙන උදුරා
මා තනි වුණා අද කිරිකැටියෙකු ද දරා
සිදුහත් රජුගෙ ගුණ කඳ නිති සිතෙහි දරා
ආසිරි පතනවා පැතුමන් ඵල දරන තුරා

ගතානුගතික කුල සිරිතට ගැති නොවමින්
ඔබටම හද පුදා අන් සරණක් නොගොසින්
පතිදම් රැක ගමින් මහ මැදුරෙහි වෙසෙමින්
විරසක වුණෝ නැත මම හිමිහට වෛරෙන්

රාහුල කුමරු නැත්නම් ඔබ ගිය ගමන
තනියම යන්න දෙන්නේ නෑ කිසිම දින
ඔබ තනි නොතනියට සෙවණැල්ලක් වෙමින
දුක සැප දෙකම විඳ ගන්නව හිමි බැතින

අඳුරේ ගිලී දුක් ගින්දර මැද තැවෙන
ලෝ සත වෙතට ආලෝකය ගෙන දෙන්න
භවයේ දුක නිවා සසරින් එතෙරට යන්න
ඔබගේ ගමන් මඟ ඉටු වේවා නිතින

සෙනෙහෙලතා රත්නායක
ක්ලේටන්

## පොසොන් සඳ

උදා හිරු කිරණින්
විකසිත වන නෙලුම් මල
නුඹ නෙළාගෙන ගොස්
පුදමි මම මුනිඳුට
උදාවුන විට පොසොන් සඳ

පිපී පරවෙන නෙලුම මෙන්
ජීවිතේ හැටි දකිමි මම්
මුනිඳුනේ ඔබ දෙසූ දම්
සාගරේ සොයමි මම්

ලොව වෙලී හීතියේ සරදම්
ඇයි මිනිසුනේ මේ නොතරම්
පමා නැත සගයනේ තවමත්
සරණ යමි මම මුනිඳුනේ සදහම්

හේමමාලි බන්ඩාරනායක

## කඳුලු ඇහිදින දේවතාවී

දේව කුලයට ලද වරම් ගෙන
තුටින් සැනහී උන්නෙමී මම
පිරූ පෙරුමන් පින් බෙලෙන් ලද
දේවතාවී නමින් සැනහින

පේව පුදසුන පේන මානෙක
යෙහෙන් වැජඹින සිරින් රූ මැද
සඳුන් කපුරු ද සුවඳ ධූම ද
පවන් සැලුවේ දේව නාමෙට

දිනෙන් දින නෙක දනෝ සපැමිණ
පේව පුදසුන වසා පරදූරින
සෙත් පතා කවි ගයා තාලෙට
බොහෝ දේ ඉල්ලීය ම වෙතින

කඩුල්ලක් දෙක තුනක් පැන්නට
තාම මම හිටි තැනම වාගෙයි
යාන වාහන හීන බිඳිනට
ඉහළ පුටුවට වරම් දෙනව ද

වංශ කුළ ගොත් ගෑවිලා නැති
කවුද මන්දා කෙළී ඩැහැගෙන
දේවියනි හිත් දෙකඩ කර හෝ
මෙ නව නින්දාවෙන් රකිනවද

අසා දහසක් දනන් යාදිනි
දරා ගත්තෙමි දෝත පා ගිනි
එවන් විට තව තවත් සපැමිණි
අනුන් හට ඉල්ලීය දුක් ගිනි

යොමා කඩතිර වෙතම යුග
යදින යාදිනි අසා සිටි මුත්
කඳුලු අරගෙන ලබා දෙනු ව
කිසිවකුදු නොතිබුණිය මා ළඟ

හරණ සූ සැට පැළඳ ඉන්නේ
රූ සිරිත් නොඅඩුවම ලැබුණෝ
පින් කළා සේ සිතා සිටි මුත්
නෑසු කන් ව ම අසා ඉන්නේ

කඳුලු අරගෙන බොහෝ අය
යදින දේ ඉටු කරනට බැරි
දිවා රෑ නින්දකට හිත නැති
දේව වරමින් පලක් නම් නැති

දේවිකා ජයසුන්දර
ඩවුටන්

## එපා

කඳුළෙන්ම වෙන් වෙලා - කඳුළෙන්ම එක් වෙලා
කඳුළෙන්ම ගොඩ නැගූ - අපේ පෙම් මන්දිරය
පාළු සොහොනක් විලස - ඇයි ද ඔබ දකින්නේ

ධන බලය - කුල බලය
නිළ බලය ඉදිරියේ
ආදරය විකුණන්න
මා පෙරුම් පුරා ගෙන
බලා සිටිනා බවක්
නේද ඔබ කියන්නේ

සිහින ලොවකදී වා - නොසිතුවෙමි කිසිම දින
ජීවිතේ හරය වූ - මිහිරි කම උසස් කම
සොඳුරු තම ආදරය - බොළඳ බඩුවක් විලස

මගෙ සිතුම් මගෙ පැතුම් - සිඳ දමා බිඳ දමා
මගෙ කඳුළු මත නැගී - සිනහාසෙන්නට එපා

ආදරය මිළ කරන - වෙළෙන්දිය කැයි කියා
මින් මනත නම් යළිත් - මා හඳුන්වනු එපා.

මාලා කරුණාතිලක
කුරුණෑගල

## බොඳ වුණු ආදරය

නෙත් ගැටුණු දා සිටම
දයාබර හිමියනේ
මා ඔබට ආදරෙන්
පිදුවෙ කුළුඳුල් පෙමක්

එදා සිට මෙදා තෙක්
ඔබම මයි මගෙ සිතේ
සිහිනෙකින් වත් මෙමා
නොපැතුවෙමි වෙන පෙමක්

සතුටු සයුරේ ගිලී
ප්‍රේමයේ පල දරා
විඳ දරා විලි රුදා
ලබා දුනි දරු පෙමක්

කියනු මැන හිමියනේ
කිමද මා කළ වරද
ඇයි ද දැන් සොයන්නේ
අන් ළඳකගේ පෙමක්

ලක්ෂ්මී ගුණරත්න

## මේක කව්තුක වස්තුවක්

අපේ පොඩි මාමා
අම්මාගෙ පොඩි මලයා
මිදූලේ මඩුවක් හදා

මී මුත්තා දැක්කු බක්කිය
ඒ මඩුවේ තියා ගෙන
සතියකට දෙකකට සැරයක්
එහි බැඳපු
මකුළු දැල් කඩා

දූවිලි ගසා පිස-දා දමා
මහත් ආදරයකිං
රැක බලා ගන්නවා

අවුරුද්දකට සැරයක්
එහි කටු කෝල හරවා
සායම් ආලේප කර ලා
එහි පරණ කම මකා
අලුත් කර තැබීමත්
ඔහු ගේ එක්තරා සිරිතක්

අසල් වැසි කිසි කෙනෙකුට
මෙහි කිසි අමුත්තක් නැත
දුර බැහැරින් පැමිණි
කිසියම් හිතවතෙක්
"මොකෝ මේ
වැඩකට නැත බක්කි කබලක්
මිදූල අවිරාතියාගෙන ඉන්නේ"

යනුවෙන් ඇසුවහොත් නම්
මාමාට ටිකක් තද වේ.
"මේ මේක ?
මේක කව්තුක වස්තුවක්
අපෙ තාත්තගෙ තාත්තා
සීයා
දැක්කු බක්කිය මේක

මං යකදුරෙක් උනා කියලා
මේක විකුණං කන්න පුලුවනැ !
පරම්පරා දෙකක්
හැදුනේත් වැඩුනේත්
අපි මේ තැනට ආවෙත්
මේක..... මේ බක්කිය නිසා !
කළ ගුණ සැලකීම
අපේ ජාතියේ
උසස් ගුණයක් නේ !

අපේ බුදු හාමුදුරුවො
සිරි මහ බෝධියට

කෙළෙහි ගුණ දැක්කූ හැටි
දන්නවා නේ අපි
අනිමිසලෝචන පූජාව
අපට දුන් ආදර්ශයක්

පොත්වල ලියවිලා නැති උනත්
අපේ බුදු හාමුදුරුවො
බෝ මලුව පිහ - පය දාලා
පිරිසිදු කරන්නත් ඇති.
ලඟ පාත පොකුණකිං
වතුර ඇදලා ගෙනැවිත්
බෝ මුලට දමන්නත් ඇති,
කිරි පතක් වත් සොයා ගෙන
බෝව නාවන්නත් ඇති"

මේ වගේ උත්තරයක්
තමයි මාමා දෙන්නේ

"ඔව්වොව් ඒකනං
එහෙම වෙන්නත් බැරි නෑ
මොකෝ ඇහු දුටු අය
ඉන්නවා කියලූයි

එතකොට ඒ කාලෙ
සීය දැක්කූ ගොනාම ද
තාත්තත් දැක්කුවේ ?"

"නෑ නෑ
අපේ තාත්තට
ගොන් නාම්බෙක් හිටියා
පොඩි එකා කාලේ
ඉඳලා ම හදා ගත්
ගොනා ඌ
තාත්තත් හදිසියේ
අපවත් උනාට පස්සේ
මං ඌ විකුණ දැම්ම
මට වැඩක් නැති නිසා "

"ඉතින් එතකොට
මේ කබල් බක්කිය
ඉතුරු කර ගත්තේ
යකදුරු උන්නැහේ
බක්කිය ඇදං යනවයි,
නැහැනේ !
ගමනක් බිමනක්
යනවා යැ ඒකෙං
ඒත් නැහැනේ ! "

වි. ක. ධර්මබන්ධු




කොවුල් හඬ නෑසේද
එරබදු මල් නොපෙනේද
පාළු වූ නගරයේ
තනිකමක් නොදැනේද

කොවුල් හඬ ඇසේයා
එරබදු මල් පිපේයා
පාළු වූ නගරයේ
තනිකම මටත් දැනේයා
එහෙත් ගම යන්න බැරි
හේතුවක් මට තියේයා

මතකයි ගිය පාර
කළු පාට අවුරුද්ද
රත්තරන් කඩුව අත
දරා කළ උදානය
ජය නොගෙන සටන යළි
ගමට නොයනා වග

මාසයෙන් මාසයට
බර අඩි තබා ගොස්
නැවතුනේ සඳ දිහා බලාගෙන
කෝච්චියෙ හූව විඳ දරාගෙන

සඳ බොහෝ දුර ගියා
විටෙක නොපෙනී ගියා
අමාවක පසුව
පාලොස්වකයි නම් කළා
සඳ වතුරෙ පීනමින්
වැට කොටු කඩුලු පනිමින්
පැතුම් එළි දල්වමින්
ගියා ඔබ මොබ කලාමැදිරින්

යළි ඇහැ ඇරෙන සඳ
රැය පමණි සුන්දර
සඳ රජ වී උන්නේ
හිරුගෙ සිංහාසනේ
විහිදමින් ඇසින් ගින්දර

කොවුල් හඬ ඇසේ හූ හඬ ලෙසේයා
එරබදු දකිමි යවටෙව් ඇස් ලෙසේයා
තනිකම විඳිමි විඳවමි පැතු ලෙසේයා
ගම එමි වෙඩි වැදී සඳ මළ දිනේයා

ගැමුණු පී. දසනායක